සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Sabaragamuwa Provincial Department of Education
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்

**තෙවන වාර පරීක්ෂණය 2017** **06 ශ්‍රේණිය**
**மூன்றாம் தவணைப் பரீட்சை 2017** **தரம் 06**
**Third Term Test 2017** **Grade 06**

**බුද්ධ ධර්මය - I කොටස**

**කාලය :-** **පැය දෙකයි**
***Two hours***

- **01 සිට 5 දක්වා ප්‍රශ්න වලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. බුදුවන්නට කාලය පැමිණ ඇතැයි බෝසතාණන්ට ආරාධනා කළේ,

   1. ශක්‍ර දේවේන්ද්‍රයා 2. සහම්පති බ්‍රහ්මයා 3. අසිත තාපසතුමා

2. සිදුහත් කුමරු ගිහිගෙය අතහැර යාම මහාභිනිෂ්ක්‍රමණය ලෙස හැඳින්වේ. එවිට එතුමාගේ වයස

   1. අවුරුදු විසි නමයකි 2. අවුරුදු තිස් එකකි 3. 4 අවුරුදු විසි හතකි

3. සද්ධාය සම්පදිත්තේන ... යන ගාථාව මගින් කියවෙන්නේ,

   i. මල් පූජා කිරීමයි
   ii. පහන් පූජා කිරීමයි
   iii. පැන් පූජා කිරීමයි

4. සීලය සම්පූර්ණ වීමට කළ යුත්ත කිරීම බුදු දහමේ හැඳින්වෙන්නේ

   i. විරතිය යනුවෙනි
   ii. විරමනය යනුවෙනි
   iii. සමාදානය යනුවෙනි

5. මස මානවක ඇතුලු පිරිස අත බලවත් වූ ඖෂධයක් ඇතැයි සැකයක් ඉපදුනේ,

   i. උදේන රජතුමාටය
   ii. මගධ රජතුමාටය
   iii. කොසොල් රජතුමාටය

- **6 - 10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

6. ශ්‍රී ලංකාවේ ජාතික ගීයේ නිර්මාතෘ වරයා වන්නේ ........................................ ය.
7. මහානාග යුවරජුගේ බිසව වන්නේ ........................................ දේවියයි.
8. සිත තුළ පැහැදීමකින් තොරව ඇතිකර ගන්නා ශ්‍රද්ධාව ........................................ ශ්‍රද්ධාවයි.
9. සිදුහත් කුමරුගේ සුලු මව වන්නේ ........................................ දේවිය යි.
10. ලොව පවතින පණ ඇති පණ නැති සෑම දෙයක්ම වෙනස් වීම ........................................ ලෙස හැඳින්වේ.

(මහා ප්‍රජාපතී ගෝතමී/ආනන්ද සමරකෝන් මහතා / අනිත්‍යතාව / අනුලා / අමූලිකා)

- **11 - 15 දක්වා ප්‍රශ්නවල නිවැරදි ප්‍රකාශයක් නම් (✔) හරි ලකුණද වැරදි නම් (×) වැරදි ලකුණද යොදන්න.**

11. මෙත්තා කරුණා මුදිතා උපේක්ඛා යනු සිවු බඹ විහරණය ( )
12. බුද්ධත්වය පතා බෝ මුල කරා යන බෝසත්වයණ්ට කොණ්ඩඤ්ඤ තවුසා කුස තණ මිටි අටක් දුන්නේය. ( )
13. සිදුහත් කුමරා ඉපදී සත් දිනකින් නම් තැබීමේ උළෙල සිදුවිය . ( )
14. දියුණුවේ දොරටු සඳහන් වන ජාතක කතාවකි අත්ථස්සද්වාර ජාතකය. ( )
15. බොරු කීමෙන් වැලකීම සම්මා කම්මන්තයට අයත් වේ. ( )

- **16 - 20 දක්වා ප්‍රශ්නවල (අ) කොටසට ගැළපෙන පිළිතුර (ආ) කොටසින් තෝරා ගෙන එයට අයත් ඉංග්‍රීසි අක්ෂරය (අ) කොටස ඉදිරියෙන් ඇති වරහන් තුළ ලියන්න.**

| (අ) | | | (ආ) |
|---|---|---|---|
| 16. තමා උපමා කොට වරදින් මිදීම | ( ) | A. | සම්මා කම්මන්තය |
| 17. වප් මඟුල් දින සිදුහත් කුමරු වඩන ලද භාවනාව | ( ) | B. | මෛත්‍රී භාවනාව |
| 18. නිවැරදි දැහැමි රැකියාවක් කිරීම | ( ) | C. | සම්මා ආජීවය |
| 19. මිතුරු සිත වර්ධනය කරයි | ( ) | D. | ආනාපාන සති භාවනාවයි |
| 20. ශික්ෂාවේ දෙවන අංගය | ( ) | E. | අත්තුපනායික ධර්ම පර්යාය |

(ලකුණු 2 x 20= 40)

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Sabaragamuwa Provincial Department of Education
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்

**තෙවන වාර පරීක්ෂණය 2017** **06 ශ්‍රේණිය**
**மூன்றாம் தவணைப் பரீட்சை 2017** **தரம் 06**
**Third Term Test 2017** **Grade 06**

**බුද්ධ ධර්මය - II කොටස**

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

(01) **පහත සඳහන් ප්‍රකාශ හරි නම් (✔) ලකුණද වැරදි නම් (×)වැරදි ලකුණද යොදන්න.**

1. අරහං යනු නව අරහාදී බුදු ගුණයකි. ( )
2. සුප්‍රබුද්ධ රජතුමාගේ දියණිය කිසා ගෝතමියයි ( )
3. පළමු ධර්ම දේශනාව පස්වග මහණුන්ට සිදු කරන ලදී ( )
4. නම් තැබීමේ උළෙලට පඬිවරු 180 ක් කැඳවන ලදී ( )
5. සියලු කෙලෙස් නසන නුවණ චුතුපපාත ඥානයයි ( )
6. මෙත් වැඩීමේ ආනිසංස 11 ක් වේ ( )
7. ශික්ෂාකාමී භික්ෂූන් අතර අග තනතුර ලැබුවේ ආනන්ද හිමිය ( )
8. දරුවන් පවින් වැළැක්වීම දෙමාපියන් සතු යුතුකමකි ( )
9. මිහිඳු හිමියන් මෙරටට වැඩම කරන විට ලක්දිවට පාලකයා වූයේ දේවානම් පියතිස්ස රජතුමාය ( )
10. බුද්ධ ශාසනයේ පැවිදිව වූ මුල්ම ශ්‍රී ලාංකිකයා අරිට්ඨ කුමරුය ( )

(ලකුණු 2 x 10 = 20)

(02) I ලෝක පරිසර දිනය කවදා ද?.

II පරිසරයෙන් අප ලැබෙන ප්‍රයෝජන 03 ක් ලියන්න.

III පරිසර ආරක්ෂා කර ගැනීමට ඔබට කළ හැකි දේවල් 05 ක් ලියන්න.

(ල. 2, 3, 5)

(03) I ශ්‍රද්ධාවේ ප්‍රධාන ප්‍රභේද 02 ක් නම් කරන්න.

II ඉන් එකක් කෙටියෙන් හඳුන්වන්න.

III ශ්‍රද්ධාවන්තයකුගේ ලක්ෂණ නම් කරන්න.

(ල. 2, 3, 5)

(04) I දැඩි ලෝභය දුකට පත්වීමට හේතුවේ. මෙය පැහැදිලි කරන ජාතක කතාව කුමක්ද?

II එම ජාතක කතාව මගින් ඔබට ලබාගත හැකි ආදර්ශ 03 ක් ලියන්න.

III ඔබ විසින් අසරණ අයෙකුට උපකාර කළ අවස්ථාවක් කෙටියෙන් විස්තර කරන්න.

(ල. 2, 3, 5)

(05) I සංඝමිත්තා තෙරණිය ලක්දිවට වැඩම කරවූයේ  කුමන පොහෝ දිනකද? .

II එම පොහොය දිනය ශාසනික වශයෙන් වැදගත්වන කරුණු 02 ක් ලියන්න.

III දුමින්දාගමනය යන තේමාව යටතේ සරල වාක්‍ය 5 ක් ලියන්න.

(ල. 2, 3, 5)

(06) I සම්පත් ආරක්ෂා කිරීමට උපදෙස් ලබා දෙන සූත්‍ර දේශනාවක් නම් කරන්න?

II එම සූත්‍රයේ සඳහන් වන උපදෙස් 03 ක් ලියන්න.

III සම්පත් ආරක්ෂා කර ගැනීමට යොමු කරවන උපදේශාත්මක වාක්‍ය 05 ක් ලියන්න.

(ල. 2, 3, 5)

(07) I තමා උපමාකොට වරදින් මිදීම බුදු දහමේ හඳුන්වන්නේ කුමන නමින්ද?

II සබ්බේ තසන්ති දණ්ඩස්ස යන ගාථාව දෙකෙක් ඔබ කැමති ගාථාවක් සම්පූර්ණ කරන්න

III ඉහත ඔබ සම්පූර්ණ කරන ලද ගාථාවේ අර්ථ ලියන්න

(ල. 2, 3, 5